ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

පුවත්පත් නිවේදනය

ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මැතිතුමා සිය කාර්යාලයේ පූර්ණ වශයෙන් රාජකාරී කරන පළමු දින විදේශ සබඳතා සහ නිපුණතා සංවර්ධන, රැකී රක්ෂා සහ කම්කරු අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා, මහවැලි, කෘෂිකාර්මික, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන සහ අභ් යන්තර වෙළඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍ය ගරු චමල් රාජපක්ෂ මැතිතුමා සහ ප්‍රජා සවිබලගැන්වීම සහ වතු යටිතල පහසුකම සංවර්ධන අමාත්‍ය ගරු ආරුමුගම තොණ්ඩමන් මැතිතුමා හමු විය.

**2.** ගරු අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා සමඟ පැවති හමුවේදී මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මැතිතුමා ඉන්දීය නායකත්වයේ සහ ජනතාවගේ සුභාසිංශන එතුමා වෙත පළ කර සිටියේය. මහ කොමසාරිස්තුමා වීඩියෝ තාක්ෂණය ඔස්සේ සිය අක්තපත්‍ර පිරිනැමීමට අවස්ථාව සලසාදීම සම්බන්ධයෙන් සිය කෘතවේදීත්වයද මෙම අවස්ථාවේදී පළ කළේය. **2020** මැයි මස **23** වන දින අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා සහ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා අතර පැවති දූරකථන සංවාදය සිහිපත් කරමින් මහ කොමසාරිස්තුමා කොවිඩ් **-19** වසංගතයේ බලපෑම් වලට මුහුණ දීමට මෙන්ම පශ්චාත් කොවිඩ් ආර්ථික පුනර්ජීවනය සඳහා ශ්‍රී ලංකාවට හැකි සෑම සහයෝගයක්ම ලබා දීමට ඉන්දියාව දක්වන දැඩි කැපවීම අවධාරණය කළේය. එසේම, ශ්‍රී ලංකාවෙ සිරව සිටින ඉන්දියානුවන් සම්බන්ධයෙන් සහ ඔවුන්ව නැවතත් සිය රටට

යැවීම සඳහා ශ්‍රී ලංකා රජය ලබා දෙන සහයෝගය වෙනුවෙන් මහ කොමසාරිස්තුමා සිය ස්තුතිය ප්‍රකාශ කළේය.

**3.** මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මැතිතුමා සහ ගරු අමාත්‍ය ආරුමුගම් තොණ්ඩමන් මැතිතුමා වතුකරයේ ක්‍රියාත්මක ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය සහ යාපනය සංස්කෘතික මධ්‍යස්ථානය ඇතුළු ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා ද්විපාර්ශවික සහයෝගීතාවය පිළිබඳ සාකච්ඡා කළෝය. **2017** වසරේ අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය අතරතුර ප්‍රකාශයට පත් කළ නිවාස **10,000** ඉදිකිරීම ඉන්දියාව භාර ගෙන ඇත. ඉන්දියාව තවදුරටත් ශ්‍රී ලංකා රජය සමඟ එක්ව ශ්‍රී ලාංකික ජනතාව වෙනුවෙන් ඉහළ ඵලදායිත්වයකින් යුත් ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාවට නංවන බව මහ කොමසාරිස්තුමා ප්‍රකාශ කළේය.

**4.** ගරු අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමාට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු සහ විවිධ විෂයන් හෙබවූ අමාත්‍යවරයකු ලෙස දීර්ඝකාලීන අත්දැකීම් ඇති බව සඳහන් කළ මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මැතිතුමා එතුමා සමඟ පැවති හමුවේදී ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සම්ප්‍රදායික බැඳීම් සහ විශේෂයෙන්ම දෙරට අතර කෘෂිකර්මාන්තය, ආහාර සුරක්ෂිතතාවය සහ ජලය යනාදී විවිධ ක්ෂේත්‍රයන්හි සහයෝගීතාවය තවදුරටත් ශක්තිමත් කිරීම පිළිබඳව එතුමාගේ යෝජනා විමසා සිටියේය.

**

කොළඹ

**1942** ජ්‍යෙෂ්ඨ **05**

**2020** මැයි **26**